

# කාර්යසාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# PERFORMANCE REPORT
# 2021

## රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව
## அரசாங்க விலைமதிப்புத் திணைக்களம்
## GOVERNMENT VALUATION DEPARTMENT

# රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව

අංක : 748, මරදාන පාර,
කොළඹ 10.
0112694381
0112694382
ෆැක්ස් : 0112694383
විද්‍යුත් තැපෑල : cv@valuationdept.gov.lk

**ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා**
මුදල් , ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය

**කේ.එම්. මහින්ද සිරිවර්ධන මහතා**
මහා භාණ්ඩාගාර ලේකම්

**පී.ඩී.ඩී.එස්. මුතුකුමාරණ මහත්මිය**
රජයේ ප්‍රධාන තක්සේරුකරු

## පටුන


**1 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ ..... 1**

**1.1** හැඳින්වීම ..... 1
**1.2** දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණ සහ මූලික වගකීම් ..... 3
**1.3** දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාදාමයන් ..... 4
**1.4** සංවිධාන ඝටහන ..... 6
**1.5** පළාත් තක්සේරු කාර්යාල ..... 7
**1.6** මූල්‍යමය කාර්යකරණය මැනීම සහ වාර්තාකරණය ..... 8

**2 පරිච්ඡේදය - කාර්යසාධනය සහ ප්‍රගතිය ..... 8**

**2.1** 1950 අංක 09 දරණ ඉඩම් අත්කරගැනීමේ පනත යටතේ පුද්ගලික දේපළ පොදු කටයුතු සඳහා වූ අනිවාර්ය අත්කර ගැනීම් වලදී සිදු කරන තක්සේරු කටයුතු ..... 8
2.2 විවිධ ප්‍රාග්ධන තක්සේරු කටයුතු සඳහා චංචල හා නිශ්චල දේපළ තක්සේරු කිරීම ..... 9
**2.3** විවිධ පනත් යටතේ සිදු කරන තක්සේරු කටයුතු ..... 9
**2.4** කුලී තක්සේරු කිරීම් ..... 9
**2.5** වත්කම් තක්සේරු ..... 10
**2.6** වරිපනම් තක්සේරු ..... 10
**2.7** ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලයේ කටයුතු පිළිබඳ ලුහුඬු විස්තරය ..... 11
**2.8** 2021 වසර තුළ පවරන ලද විශේෂ ව්‍යාපෘති ..... 11

**3 පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය ..... 14**

**3.1** 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 14
***3.2*** 2021 දෙසැම්බර් 31 දිනට ම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ..... 16
***3.3*** මූදල් ප්‍රවාහ ප්‍රකාශය ..... 17
**3.4** ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය ..... 19
**3.5** වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය ..... 19
**3.6** මු.රෙ. 208 කාරව , වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල කියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන ..... 19
***3.7*** විගණකාධිපතිවරයාගේ වාර්තාව ..... 19

**4 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක..... 20**

***4.1*** ආයතනයේ කාර්යසාධන දර්ශක..... **20**

***5*** **පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය20**

***5.1*** හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු ..... **20**

***6*** **පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ ..... 21**

**6.1** සේවක සංඛ්‍යා කලමනාකරණය..... **21**

***6.2*** මාසයක් පාසා නිම කිරීමට නොහැකිව ඉතිරි වූ ගොනු ප්‍රමාණය..... **22**

***6.3*** මානව සම්පත් සංවර්ධනය..... **23**

***7*** **පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව ..... 27**

# 1 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ

## 1.1 හැදින්වීම

වර්ෂ 1815 දී මෙරට පුරා ව්‍යාප්තව ස්ථාපිත වූ බ්‍රිතාන්‍යයීය පාලනය රටේ ඉඩම් අයිතිය, ඉඩම් පරිහරණය සහ ඉඩම් හිමිකාරිත්වය යන විෂයන්හි වෙනස්කම් ඇති කෙරිණි.. 1863 අංක 2 දරණ ආඥා පනත මඟින් පොදු පරිහරණය පිණිස පුද්ගලික ඉඩම්වල සන්තකය ලබා ගැනීමටත්, ඉඩම් මැන සමීක්ෂණය කර තක්සේරු කිරීමටත් කිරීටයට හැකි වන්නා වූ නීතිමය හිමිකම් ඇති කෙරිණි. රජයේ දේපළ වල වාර්ෂික තක්සේරුවක් කිරීමටත්, නාගරික ප්‍රදේශවල පිහිටි නිශ්චල දේපළ තක්සේරු කිරීමටත්, ඉඩම් වලට අදාළ වෙනත් තක්සේරු කටයුතු කිරීමටත් 1921 ජූනි මස 1 වන දින පළාත් පාලන මණ්ඩලයක් පිහිටුවන ලදි. රජයේ තක්සේරුකරු තනතුර සහ ඔහුගේ කාර්ය මණ්ඩලය සඳහා වූ ප්‍රතිපාදන පළාත් පාලන මණ්ඩලය යටතේ වෙන් කරන ලද අතර කිරීටය සතු දේපළ තක්සේරු කිරීම, බූදල් බදු සඳහා තක්සේරු කිරීම සහ ප්‍රාදේශීය බල මණ්ඩලවලට අයත් ඉඩම් අත්පත් කර ගැනීම හා ඒවායේ අගය තක්සේරු කිරීම යනාදී කාර්යයන් භාරව කටයුතු කරනු පිණිස රජයේ තක්සේරුකරු තනතුර 1923 වර්ෂයේ දී ඇති කරන ලදි.

වර්ෂ 1939 දී, භාණ්ඩාගාරයේ තක්සේරු අංශය සහ පළාත් පාලන තක්සේරුකරුවන්ගේ දෙපාර්තමේන්තුව යනුවෙන් වූ ආයතන දෙකක් රජය වෙනුවෙන් තක්සේරු කටයුතු වල නිරතව සිටියේ ය. වියදම් කපා හැරීමේ ක්‍රියා මාර්ගයක් ලෙස ඉහත සඳහන් ඒකක දෙක ඒකාබද්ධ කර අභිනව දෙපාර්තමේන්තුවක් යටතේ එක් නිලධරයෙකු භාරයේ තැබීමට තීරණය කෙරුණු අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් 1939 ඔක්තෝබර් මාසයේ දී ප්‍රධාන තක්සේරුකරු ලෙස කපිතාන් ඊ.ජී. ඊස්ට්මන් මහතා පත් කරනු ලැබිණි.

මෙම කාලය අතරතුර තක්සේරු කටයුතු ක්ෂේත්‍රයේ වෘත්තීයමය තත්ත්වය ඔසවා තැබීමේ අරමුණ පෙරදැරිව තක්සේරුකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් ලංකා කාර්මික විද්‍යාලයෙහි ආරම්භ කරන ලදි. තක්සේරුකරුවන් සඳහා වූ වෘත්තීය අධ්‍යයන පාඨමාලාවක් වන දේපළ කළමනාකරණය පිළිබඳ උපාධිය 1972 දී කොළඹ විශ්ව විද්‍යාලයෙන් ආරම්භ කර, පසුව ඊළඟ වර්ෂයේ සිට එම උපාධිය විද්‍යෝදය විශ්ව විද්‍යාලයෙහි ද (දැනට ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය) ඉගැන්වීම ඇරැඹිණි. අද වන විට තක්සේරු දෙපාර්තමේන්තුවට අවශ්‍ය උපාධිධාරී වෘත්තිකයන් බිහි කර දෙන ප්‍රධාන ප්‍රභවය වන්නේ මෙයයි. දෙපාර්තමේන්තුවේ තක්සේරු නිලධාරීන් බඳවා ගැනීමේ මූලික මට්ටම උපාධිය දක්වා ඉහළ දැමුණු අතර මේ වන විට දෙපාර්තමේන්තුවට බඳවා ගනු ලබන්නේ දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය දරන්නන් පමණි.

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මෙරට සමාජ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට සුවිශේෂී දායකත්වයක් සපයන බව පොදු මහජනතාව විෂයෙහි ප්‍රකට කරුණකි. වසර 98 කටත් අධික ඉතිහාසයක් සපුරා සිටි අපගේ පුරෝගාමීන් ඔවුන්ගේ විචක්ෂණ දැනුම හා ප්‍රගුණතාව සමගින් තක්සේරුකරණය හා දේපළ

කළමනාකරණය පිළිබඳ සම්ප්‍රදායන් සහ උසස් ප්‍රමිතීන් පවත්වා ගනු ලබන රාජ්‍ය අංශය තුළ පවත්නා කීර්තිමත් වෘත්තීය ආයතනයක් අප වෙත උරුම කර තබා ගියහ. ඔවුන් සිය කැපවීම තුළින් හා නිසි ගරුත්වය සහ අධි වෘත්තීය භාවය මතින් ගොඩ නැගූ ක්‍රමවේදයන් ඔස්සේ අප හට විද්‍යාමාන කරනුයේ, සේවා සැපයීමෙහිලා වෘත්තීය මට්ටමේ හා ඉහළම ගණයේ තක්සේරුකරුවන් ලෙස කෙතරම් විශිෂ්ට අයුරින් අප කටයුතු කළ යුතු ද යන්නයි.

මෙම කාර්ය සාධන හා ගිණුම් දැක්වීමේ වාර්තාව, අප තක්සේරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන සැලැස්මෙහි නියම කරනු ලැබ ඇති ඉලක්ක හා අරමුණු එල්ලේ තථ්‍ය ප්‍රතිඵල සංසන්දනාත්මකව දැක්වෙන එහි පරමාර්ථ හා කර්තව්‍යයන් ද, එහි කාර්ය සාධන ක්‍රියා මාර්ගවල හා ප්‍රගතියේ සුවිශේෂ අවස්ථා ද විදහා දැක්වෙන පූර්විකාවේ කූයි ප්‍රාප්තියයි. එම කටයුතු, මෙරට සමාජ ආර්ථික සංවර්ධනය උදෙසාත්, දෙපාර්තමේන්තුවේ මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලිය උදෙසාත් දායක කරගනු පිණිස සහය සලසා ගැනීමේ අටියෙන් දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලද කාර්යයන් වන්නේ ය. අදාළ සැලසුම් උපායමාර්ග නොකඩවා ඉටු කිරීම ආරම්භ කරමින් ශ්‍රී ලංකා මුදල් අමාත්‍යාංශය යටතේ ස්වකීය අය වැය ලේඛනය ක්‍රමානුයෝජනය, එහි වැඩ ඉටු කිරීම හා ඊට සාධාරණය සැලසෙන අයුරින් කටයුතු කිරීම යන කාර්යයන් තක්සේරු දෙපාර්තමේන්තුව ඉෂ්ට සිද්ධ කළේය. මෙම වාර්තාව පිළියෙළ කෙරෙනුයේ ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසිවලට අයත් නියමයන්ට අනුකූලව වන අතර 2021 වර්ෂය තුළ තක්සේරු දෙපාර්තමේන්තුවේ කාර්ය කටයුතු මින් ආවරණය කරනු ලැබේ.

## 1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණ සහ මූලික වගකීම්

**“අපගේ දැක්ම”**

**“නිශ්චල දේපළ තක්සේරුකරණ සහ කළමනාකරණ විෂයයෙහිලා ගෝලීය ප්‍රමිතීන් පදනම් වූ ප්‍රශස්ත වෘත්තීයමය සේවාවන් තුළින් සමාජ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම”**

---

**“අපගේ මෙහෙවර”**

**“කාර්යක්ෂම හා ඵලදායී කළමනාකරණ ව්‍යුහයක් තුළින් තරඟකාරීව මෙන්ම පිරිවැය පිළිබඳ සවිඥාණිකව ශ්‍රී ලංකා රජයට පූර්ණ වෘත්තීයමය තක්සේරු හා දේපළ කළමනාකරණ සේවාවන් සැපයීම.”**

---

**“අපගේ අරමුණ”**

**“මෙම දෙපාර්තමේන්තුවේ අරමුණු වනුයේ සේවාදායකයින් වෙත ප්‍රතිඵල සාධනය ඉලක්ක කරගත් විශිෂ්ටතම කාර්ය චර්යා ප්‍රමිතීන් මත පිහිටා උසස් වෘත්තීයමය සේවාවන් සැපයීමයි.”**

---

**“අපගේ මූලික වගකීම්”**

**“තක්සේරු දෙපාර්තමේන්තුව, තම ව්‍යවස්ථාපිත වගකීම් හැරුණු විට, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන උදෙසා විස්තීර්ණ තක්සේරු සේවාවන් හා දේපළ කළමනාකරණ සේවාවන් සැපයීමේ වගකීම උසුලයි.”**

## 1.3 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාදාමයන්

දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය සම්බන්ධයෙන් පළාත් සභා සහ පළාත් පාලන ආයතන ඇතුළුව රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන සඳහා දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන සේවාවන් ප්‍රධාන වශයෙන් පහත සඳහන් අයුරින් වර්ගීකරණය කළ හැකි ය.

1. <u>1950 අංක 09 දරණ ඉඩම් අත්කරගැනීමේ පනත යටතේ පුද්ගලික දේපළ පොදු කටයුතු සඳහා වූ අනිවාර්ය අත්කර ගැනීම් වලදී සිදු කරන තක්සේරු කටයුතු</u>

   1.1 17(1) වගන්තිය යටතේ ගෙවිය යුතු වන්දි තක්සේරු වාර්තා පිළියෙළ කිරීම.

   1.2 38 (අ) වගන්තිය යටතේ හදිසි සංවර්ධන කාර්ය කටයුතු උදෙසා අත්කර ගනු ලබන ඉඩම්වල ඉදිරි වන්දි තක්සේරු සඳහා තත්ත්ව වාර්තා පිළියෙළ කිරීම.

   1.3 ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ යථා කාලයේදී කෙරෙන දේපළ අත්කරගැනීම් සඳහා වන්දිමුදල් ප්‍රතිපාදනයන් වෙන්කර ගැනීම උදෙසා දේපළ ඇස්තමේන්තු තක්සේරු වාර්තා පිළියෙළ කිරීම.

2. <u>විවිධ ප්‍රාග්ධන තක්සේරු කටයුතු සඳහා චංචල හා නිශ්චල දේපළ තක්සේරු කිරීම</u>

   2.1 පුද්ගලික ගිවිසුම් මත දේපළ මිලදී ගැනීම හා සන්තකය බැහැර කිරීම සඳහා තක්සේරු ලබා දීම

   2.2 දීර්ඝකාලීන (99 අවුරුදු) , මධ්‍යමකාලීන (50 අවුරුදු) , කෙටිකාලීන (30 අවුරුදු) හා වෙනත් බදු කාර්යය සඳහා තක්සේරු කිරීම.

   2.3 මහ භාණ්ඩාගාරයේ ඉල්ලීම මත, රාජ්‍ය ව්‍යවසායන් සඳහා ව්‍යාපාර තක්සේරු කටයුතු සිදුකිරීම.

   2.4 ආපදා කළමනාකරණ තත්ත්ව කාර්යයන් යටතේ වන්දි තක්සේරු කිරීම.

   2.5 අධිකරණවලට හා විවිධ විනිශ්චය සභාවලට තක්සේරු සම්බන්ධ ආරවුල් විභාග කරීම සඳහා තක්සේරු ලබා දීම.

3. <u>විවිධ පනත් යටතේ සිදු කරන තක්සේරු කටයුතු</u>

   අල්ලස් පනත, මුද්දර බදු පනත සහ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත වැනි ව්‍යවස්ථාමය ප්‍රතිපාදන යටතේ බලය ලබා දී ඇති තක්සේරු කිරීම් සිදු කරන ලෙස ප්‍රධාන තක්සේරුකරු හට නියම වූ විට අදාළ දේපළ තක්සේරු කිරීම.

4. <u>කුලී තක්සේරු</u>

   4.1 රජයේ නිවාසවල පදිංචි වී සිටින රජයේ සේවකයින්ගෙන් ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයට අනුව එම නිවාස කුලී හෝ දණ්ඩන කුලී අය කර ගැනීම සඳහා කුලී තක්සේරු සැපයීම.

   4.2 රජයේ හා රාජ්‍ය ආයතනවල දේපළ පුද්ගලික අංශයට කුලියට දීම සහ පුද්ගලික දේපළ රජයට සහ රාජ්‍ය අනුබද්ධ ආයතනවලට කුලියට ගැනීමට අවශ්‍ය වූ විට ඒ සඳහා කුලී තක්සේරු සැපයීම.

**05** <u>වත්කම් තක්සේරු</u>

1. ගිණුම්කරණ කාර්යයන් සඳහා වත්කම් තක්සේරු කිරීම.
    - රාජ්‍ය ආයතන වත්කම්
    - ව්‍යාපාර ආයතන වත්කම්
    - පළාත් පාලන ආයතන වත්කම්
    - වෙනත් අර්ධ රාජ්‍ය ආයතන වත්කම්

**06.** <u>වරිපනම් තක්සේරු</u>

**6.1** කොළඹ මහනගර සභා සීමාව තුළ පිහිටි දේපළ හැර දිවයිනේ වරිපනම් බදු අය කෙරෙන සියලුම පළාත් පාලන ආයතනයන්ට අයත් දේපළවල වරිපනම් බදු අයකිරීමේ කාර්යය උදෙසා වසර 5 කට වරක් කරනු ලබන තක්සේරු.

**6.2** ඊට අතෘප්තිමත් පුද්ගලයින් විසින් වරිපනම් තක්සේරු වලට එරෙහිව ඉදිරිපත් කෙරෙන විරෝධතා පිළිබඳ නිශ්චය කිරීමේ දී වෘත්තීය සහය දැක්වීම.

**6.3** එම පළාත් පාලන ආයතනවල වසර 5 අතරතුර හිමිකම් වෙනස්වීම් වලට අදාලව වරිපනම් බදු අය කර ගැනීම සඳහාද වාර්තා ලබා දීම.

**6.4** එම පළාත් පාලන ආයතනවල වසර 5 අතරතුර නව ඉදිකිරීම් වලට අදාලව වරිපනම් බදු අය කර ගැනීම සඳහාද වාර්තා ලබා දීම.

**6.5** කොළඹ මහ නගර සභාවේ වරිපනම් බදු කටයුතු සඳහා කොළඹ මහ නගර සභා සීමාව තුළ පිහිටි රජය සතු දේපළවල වාර්ෂික වටිනාකම් තක්සේරු කර දීම

**07.** <u>උපදේශන සේවා සහ සාක්ෂි සැපයීම</u>

**7.1** වන්දි මුදල් හා තක්සේරු ආරවුල් විභාග කර විසඳුම් ලබා දෙන අධිකරණවලට හා විවිධ වන්දි විනිශ්චය සභාවලට විශේෂඥ සාක්ෂි ලබා දීම.

**7.2** ප්‍රධාන තක්සේරුකරු නියෝජනය කරමින් ගෙවල් කුලී පනත යටතේ ස්ථාපිත ගෙවල් කුලී මණ්ඩලවලට සහභාගී වීම.

**7.3** ප්‍රධාන තක්සේරුකරු නියෝජනය කරමින් විශේෂඥ සාක්ෂි සඳහා අත්කර ගැනීම් පනත යටතේ වන වන්දි සමාලෝචන මණ්ඩලවලට සහභාගී වීම.

**7.4** ප්‍රධාන තක්සේරුකරු නියෝජනය කරමින් ඉඩම් අත්කර ගැනීමේ ප්‍රතිස්ථාපන කමිටුවල **(LARC)** සහභාගී වීම

**7.5** ප්‍රධාන තක්සේරුකරු නියෝජනය කරමින් ඉඩම් අත්කර ගැනීමේ විශේෂ ප්‍රතිස්ථාපන කමිටුවලට **( Super LARC)** සහභාගි වීම.

**7.6** ඉඩම් අත්කරගැනීමේ පනතේ **63(2) (ඊ)** යටතේ පැනවූ **2008** රෙගුලාසි යටතේ හිමිකම් පරීක්ෂණ සඳහා වන්දි උපදේශන සේවා ලබා දීම.

## 1.4 *සංවිධාන සටහන*

**ORGANIZATION STRUCTURE OF THE DEPARTMENT OF VALUATION**




*** Note - Abbreviations attached**

**Abbreviations**

| | |
|---|---|
| **CV** | **Chief Valuer** |
| **ACV** | **Additional Chief Valuer** |
| **DCV** | **Deputy Chief Valuer** |
| **SV** | **Senior Valuer** |
| **V** | **Valuer** |
| **AV** | **Assistant Valuer** |
| **CA** | **Chief Accountant** |
| **CIA** | **Chief Internal Auditor** |
| **LO** | **Legal Officer** |
| **AO** | **Administration Officer** |
| **MSO** | **Management Service Officer** |
| **DO** | **Development Office** |
| **ICT A.** | **ICT Assistant** |
| **BK** | **Budget Keeper** |
| **OES** | **Office Emploee Service** |
| **DRI** | **Driver** |

| | |
|---|---|
| **CM I** | **Colombo Metro I** |
| **CM II** | **Colombo Metro II** |
| **WC I** | **Western Central I** |
| **WC II** | **Western Central II** |
| **WN** | **Western North** |
| **WS** | **Western South** |
| **S/G** | **Southern Galle** |
| **S/M** | **Southern Matara** |
| **S/H** | **Southern Hambanthota** |
| **SAB** | **Sabaragamuwa** |
| **UVA** | **Uva** |
| **NW** | **North Western** |
| **NC** | **North Central** |
| **NO** | **Northern** |
| **C I** | **Central I** |
| **C II** | **Central II** |
| **EA** | **Eastern** |

| | |
|---|---|
| **SO** | **Secretary Office** |
| **ADMIN** | **Administration Section** |
| **ICT** | **Information& Communication Technology Division** |
| **SDC** | **Skills Development Center** |
| **CORE** | **Reserch & Development Division** |

## 1.5 පළාත් තක්සේරු කාර්යාල

| | තක්සේරු කාර්යාලය | දුරකතන අංකය | | විද්‍යුත් තැපෑල | ෆැක්ස් |
|---|---|---|---|---|---|
| | | ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු | තක්සේරුකරු | | |
| බස්නාහිර පළාත | මහ කොළඹ | **0112674477** | **0112674478** | valdept.metro@gmail.com | **0112674477** |
| | බටහිර මධ්‍යම I | **0112843091** | **0112843204** | valdept.west.centralsub@gmail.com | **0112843091** |
| | බටහිර මධ්‍යම II | **0112698688** | **0112695905** | valdept.west.central@gmail.com | **0112698688** |
| | බටහිර උතුර | **0332221064** | **0332223869** | valdept.west.north@gmail.com | **0332221064** |
| | බටහිර දකුණ | **0342222643** | **0342222655** | valdept.west.south@gmail.com | **0342222643** |
| මධ්‍යම පළාත | මධ්‍යම I | **0812222559** | **0812222556** | valdept.central1@gmail.com | **0812222559** |
| | මධ්‍යම II | **0812211166** | **0812211165** | valdept.central2@gmail.com | **0812211166** |
| දකුණු පළාත | ගාල්ල | **0912222612** | **0912222612** | valdept.galle@gmail.com | **0912222612** |
| | මාතර | **0412223016** | **0412222612** | valdept.southern@gmail.com | **0412223016** |
| | හම්බන්තොට | **0472225612** | **0472225612** | valdept.southernsub@gmail.com | **0472225612** |
| | උතුරු මැද | **0252234035** | **0252234036** | valdept.north.central@gmail.com | **0252234035** |
| | වයඹ | **0372225280** | **0372225280** | valdept.north.west@gmail.com | **0372225280** |
| සබරගමුව | රත්නපුර | **0452226845** | **0452226985** | valdept.sabaragamuwa@gmail.com | **0452226845** |
| | කෑගල්ල | **0352050281** | **0352050281** | valdept.kegalle@gmail.com | **0352050281** |
| | ඌව | **0552222486** | **0552224153** | valdept.uva@gmail.com | **0552222486** |
| | නැගෙනහිර | **0652225646** | **0652223469** | valdept.eastern@gmail.com | **0652223469** |
| උතුරු පළාත | යාපනය | **0212224957** | **0212224957** | valdept.northern@hotmail.com | **0212224957** |
| | වවුනියාව | **0242229653** | **0242229652** | valdept.northern.vanni@gmail.com | **0242229653** |

### 1.6 මූල්‍යමය කාර්යකරණය මැනීම සහ වාර්තාකරණය

| දෙපාර්තමේන්තු වකුලේඛ 2020/02 | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|
| ගාස්තු අය කරන ආයතන වලින් කැඳවූ සත්‍ය ගාස්තු (රු.) | 164,110,234.13 | 142,902,142.00 | 277,137,469 | 175,740,186.77 | 308,346,197.27 |
| ගාස්තු අය නොකරන ආයතන සඳහා ගණනය කළ කල්පිත ගාස්තු (රු.) | 75,000,000.00 | 80,000,000.00 | 307,239,233 | 684,268,966.25 | 954,954,671.81 |

## 2 පරිච්ඡේදය - කාර්යසාධනය සහ ප්‍රගතිය

### 2.1 1950 අංක 09 දරණ ඉඩම් අත්කරගැනීමේ පනත යටතේ පුද්ගලික දේපළ පොදු කටයුතු සඳහා වූ අනිවාර්ය අත්කර ගැනීම් වලදී සිදු කරන තක්සේරු කටයුතු

| තක්සේරු වර්ගය | 2021 ප්‍රගතිය (ඒකක) | 2021 ප්‍රගතිය (ප්‍රතිශතය) | 2022 ඉලක්කගත ඒකක |
|---|---|---|---|
| **1.1 17(1) වගන්තිය යටතේ ගෙවිය යුතු වන්දි තක්සේරු වාර්තා පිළියෙළ කිරීම - LA** | **8084** | **105 %** | **15524** |
| **1.2 38 (අ) වගන්තිය යටතේ හදිසි සංවර්ධන කාර්ය කටයුතු උදෙසා අත්කර ගනු ලබන ඉඩම්වල ඉදිරි වන්දි තක්සේරු සඳහා තත්ත්ව වාර්තා පිළියෙළ කිරීම - CR** | **3829** | **130 %** | **3500** |
| **1.3 ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ යථා කාලයේදී කෙරෙන දේපළ අත්කරගැනීම් සඳහා වන්දිමුදල් ප්‍රතිපාදනයන් වෙන්කර ගැනීම උදෙසා දේපළ ඇස්තමේන්තු තක්සේරු වාර්තා පිළියෙළ කිරීම - LE** | **564** | **81 %** | **688** |

*** 2.8 අයිතමයෙහි සඳහන් විශේෂ ව්‍යාපෘති යටතේ සිදු කරන ලද තක්සේරු කටයුතු වේ.**

## 2.2 විවිධ ප්‍රාග්ධන තක්සේරු කටයුතු සඳහා චංචල හා නිශ්චල දේපළ තක්සේරු කිරීම

| තක්සේරු වර්ගය | 2021 ප්‍රගතිය (ඒකක) | 2021 ප්‍රගතිය (ප්‍රතිශතය) | 2022 ඉලක්කගත ඒකක |
|---|---|---|---|
| පුද්ගලික ගිවිසුම් මත දේපල මිලදී ගැනීම සහ සන්තකය බැහැර කිරීම මෙන්ම බදු කාර්යය උදෙසා හා වෙනත් කාර්යයන් සඳහා චංචල හා නිශ්චල දේපල තක්සේරු කිරීම - **LM** | 12953 | 113 % | 15543 |

ඉහත වගුවේ ප්‍රගතියන්හි පහත ගොනු ප්‍රමාණ ද ඇතුළත් වේ.

| ආයතනය | ගොනු ප්‍රමාණය |
|---|---|
| නාගරික සංවර්ධන අධිකාරිය<br>*වරාය නගරය සහ විශේෂ ආයෝජන ව්‍යාපෘති ද ඇතුළත් වේ. | 207 |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 204 |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | 26 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 39 |
| මහවැලි අධිකාරිය | 498 |
| ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | 180 |

## 2.3 විවිධ පනත් යටතේ සිදු කරන තක්සේරු කටයුතු

| තක්සේරු වර්ගය | 2021 ප්‍රගතිය (ඒකක) | 2021 ප්‍රගතිය (ප්‍රතිශතය) | 2022 ඉලක්කගත ඒකක |
|---|---|---|---|
| අල්ල්ස් පනත යටතේ තක්සේරු කිරීම - **BC** | 1 | 100 % | වසර ඇතුලත සිදුකරන ලබන සියලු තක්සේරු ඉල්ලීම් |
| මුද්දර බදු පනත යටතේ තක්සේරු කිරීම් - **SD** | 17 | 34 % | 53 |

## 2.4 *කුලී තක්සේරු කිරීම්*

| තක්සේරු වර්ගය | 2021 ප්‍රගතිය (ඒකක) | 2021 ප්‍රගතිය (ප්‍රතිශතය) | 2022 ඉලක්කගත ඒකක |
|---|---|---|---|
| 4.1 රජයේ නිවාසවල පදිංචි වී සිටින රජයේ සේවකයින්ගෙන් ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයට අනුව එම නිවාස කුලී හෝ දණ්ඩන කුලී අය කර ගැනීම සඳහා කුලී තක්සේරු සැපයීම– **RG** | 3897 | 141 % | 3003 |
| 4.2 රජයේ හා රාජ්‍ය ආයතනවල දේපළ පුද්ගලික අංශයට කුලියට දීම සහ පුද්ගලික දේපළ රජයට සහ රාජ්‍ය අනුබද්ධ ආයතනවලට කුලියට ගැනීමට අවශ්‍ය වූ විට ඒ සඳහා කුලී තක්සේරු සැපයීම - **RP** | 6432 | 116 % | 7541 |

## 2.5 වත්කම් තක්සේරු

| තක්සේරු වර්ගය | 2021 ප්‍රගතිය (ඒකක) | 2021 ප්‍රගතිය (ප්‍රතිශතය) | 2022 ඉලක්කගත ඒකක |
|---|---|---|---|
| රාජ්‍ය ආයතන වත්කම් | 1122 | 119 % | 1840 |
| ව්‍යාපාර ආයතන වත්කම් | 98034 | 162 % | 5962 |
| පළාත් පාලන ආයතන වත්කම් | 3544 | 100 % | 3488 |
| වෙනත් අර්ධ රාජ්‍ය ආයතන වත්කම් | 20880 | 100 % | 947 |

- අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 42 කට අයත් රාජ්‍ය වත්කම් තක්සේරුවලට අදාළ ගොනු 241 ක් නිම කරන ලදි.
- රාජ්‍ය නොවන ආයතන 25 කට අයත් වත්කම් තක්සේරුවලට අදාළ ගොනු 232 ක් නිම කරන ලදි.

## 2.6 වරිපනම් තක්සේරු

| තක්සේරු වර්ගය | 2021 ප්‍රගතිය (ඒකක) | 2021 ප්‍රගතිය (ප්‍රතිශතය) | 2022 ඉලක්කගත ඒකක |
|---|---|---|---|
| <u>වරිපනම් ප්‍රතිශෝධන</u><br>මූලික සමීක්ෂණ - **PS**<br>අවසන් පරීක්ෂණ - **FI**<br>මූලික සමීක්ෂණ හා අවසන් පරීක්ෂණ (එකවර) | <br>14584<br>74100<br>90243 | <br>31 %<br>166 %<br>88 % | <br>70990<br>57307<br>425336 |
| ඊට අතෘප්තිමත් පුද්ගලයින් විසින් වරිපනම් තක්සේරුවලට එරෙහිව ඉදිරිපත් කෙරෙන විරෝධතා පිළිබඳ නිශ්චය කිරීමේ දී වෘත්තීය සහය දැක්වීම - **RO** | 4961 | 102 % | 6507 |
| පළාත් පාලන ආයතනවල වසර 5 අතරතුර හිමිකම් වෙනස්වීම් වලට අදාලව වරිපනම් බදු අය කර ගැනීම සඳහාද වාර්තා ලබා දීම - **RA** | 24823 | 119 % | 25490 |
| පළාත් පාලන ආයතනවල වසර 5 අතරතුර නව ඉදිකිරීම් වලට අදාලව වරිපනම් බදු අය කර ගැනීම සඳහාද වාර්තා ලබා දීම - **RB** | 1824 | 119 % | 1820 |

**2021** වර්ෂය තුළදී පළාත් පාලන ආයතන **11** ක වරිපනම් තක්සේරු නිම කර ඇති අතර පළාත් ආයතන **13** ක තක්සේරු කටයුතු සිදු කෙරෙමින් පවතී.

## 2.7 ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලයේ කටයුතු පිළිබඳ ලුහුඬු විස්තරය

| අභියාචනා වර්ගය | ලද ගණන | විභාග කළ |
|---|---|---|
| ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය | **345** | **87** |
| ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ කටයුතු කරන ලද අභියාචනා | **26** | **01** |
| අභියාචනාධිකරණය ඉදිරියේ දී කටයුතු කරන ලද අභියාචනා | **32** | **01** |
| මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ දී කටයුතු කරන ලද අභියාචනා | **04** | **00** |
| දිසා අධිකරණ ඉදිරියේ දී කටයුතු කරන ලද අභියාචනා | **96** | **00** |

**මීට අමතරව ප්‍රධාන තක්සේරුකරු නියෝජනය කරමින් ගෙවල් කුලී පනත යටතේ ස්ථාපිත ගෙවල් කුලී මණ්ඩලවලට සහභාගී වීම් 94 ක් ද ඉඩම් අත්කර ගැනීමේ ප්‍රතිස්ථාපන කමිටුවල (LARC) සහභාගී වීම් 1282 ක් ද ඉඩම් අත්කර ගැනීමේ විශේෂ ප්‍රතිස්ථාපන කමිටුවලට ( Super LARC) සහභාගි වීම් 261 ක් ද සිදු කරන ලදි.**

## 2.8 2021 වසර තුළ පවරන ලද විශේෂ ව්‍යාපෘති

| අංකය | වගකිව යුතු පළාත් කාර්යාලය | ව්‍යාපෘති |
|---|---|---|
| 1 | මහ කොළඹ | නව කැළණි පාලම ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම |
| | | ශාන්ත සෙබස්තියන් උතුරු ඇල ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්කර ගැනීම |
| | | කොම්පඤ්ඤවීදිය ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්කර ගැනීම |
| | | අලුත් මාවත ප්‍රදේශයේ ප්‍රධාන ඇලේ සිට මුහුදු දක්වා උමං ජලාපවහන මාර්ගයක් ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම |
| | | මට්ටක්කුලිය පාලම පිවිසුම් මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම |
| | | රාජගිරිය ගුවන් පාලම සඳහා ඉඩම් අත්කර ගැනීම |
| | | කොල්ලුපිටිය - ශ්‍රී ජයවර්ධනපුර මාර්ගය, වැලිකඩ - නාවල මාර්ගය සහ වැලිකඩ - රාජගිරිය මාර්ගය සඳහා ඉඩම් අත්කර ගැනීම |
| | | කිරුළපන ගොඩගම මාර්ගය සඳහා ඉඩම් අත්කර ගැනීම |
| | | කිරුළපන ගොඩගම මාර්ගය සඳහා ඉඩම් අත්කර ගැනීම |
| | | කොළඹ හොරණ මාර්ගය සඳහා ඉඩම් අත්කර ගැනීම |
| | | වේරළ් ගඟ වැසිජල අපවහන හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්කර ගැනීම |
| | | ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගය සඳහා ඉඩම් අත්කර ගැනීම |
| | | ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගය සඳහා ඉඩම් අත්කර ගැනීම |
| | | කැළණිමුල්ල - කොස්වත්ත මාර්ගය සඳහා ඉඩම් අත්කර ගැනීම |
| | | බේස්ලයින් මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය |
| | | පාමංකඩ පාලම පුළුල් කිරීම |
| | | ටොරින්ටන් ඇවනිව් ඉඩම අත්කර ගැනීම |

| | | |
|---|---|---|
| | | මිරිහාන ජුබිලි කණුව මංසන්ධිය පුළුල් කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම |
| 2 | බටහිර මධ්‍යම I | වේරැස් ගඟ ව්‍යාපෘතිය - කැස්බෑව |
| | | පිළියන්දල - මහරගම මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය |
| | | පාමංකඩ - හොරණ මාර්ගය |
| | | මොරටුව රාවතාවත්ත වටරවුමේ සිට කොස්පැලෑන පාලම දක්වා මාර්ගය (සොයිසා පාර) පුළුල් කිරීම |
| | | තලවතුගොඩ හෝකන්දර මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය |
| | | කිරුලපන ගොඩගම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය |
| | | වේරැස්ගඟ ව්‍යාපෘතිය - දෙහිවල |
| | | දෙහිවල - කව්ඩාන - අත්තිඩිය මාර්ගය පුළුල් කිරීම ඉඩම් අත් කර ගැනීම |
| | | කොළඹ හොරණ මාර්ගය පුළුල් කිරීම ඉඩම් අත්කර ගැනීම |
| | | මෙරින් ඩ්‍රයිව් සංවර්ධන ව්‍යාපෘතිය |
| 3 | බටහිර මධ්‍යම II | කොට්ටාව - තලගල පාර |
| | | තඩුවෙල - අතුරුගිරිය පාර |
| | | පොල්පිටිය - පන්නිපිටිය CEB ව්‍යාපෘතිය |
| 4 | බටහිර උතුර | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර 1 කඩවත සිට මීරිගම දක්වා |
| | | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර 2 මීරිගම සිට කුරුණෑගල දක්වා |
| | | බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය |
| 5 | බටහිර දකුණ | රුවන්පුර අධිවේගී මාර්ගය |
| 6 | ගාල්ල | ගාල්ල බද්දේගම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය |
| | | මොරගොඩ ඇල සංවර්ධන ව්‍යාපෘතිය |
| | | ඉමදුව නගර සංවර්ධන ව්‍යාපෘතිය |
| 7 | මාතර | කොළඹ - හම්බන්තොට - වැල්ලවාය මාර්ගය පුළුල් කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම |
| | | දික්වැල්ල බෙලිඅත්ත මාර්ගය වලස්ගල මංසන්ධිය පුළුල් කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම |
| | | තිහගොඩ - කඹුරුපිටිය - මාවරල - කොටපොල මාර්ගයේ පුළුල් කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම |
| | | තිහගොඩ - කඹුරුපිටිය - මාවරල - කොටපොල මාර්ගය (වට රවුම අසල) පුළුල් කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම |
| 8 | හම්බන්තොට | දක්ෂිණ අධිවේගී මාර්ගය පුළුල් කිරීම සහා ඉඩම් අත්කර ගැනීමේ ව්‍යාපෘතිය |
| | | මිරිජ්ජවිල - සූරියවැව අඩි 100 මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්කර ගැනීමේ ව්‍යාපෘතිය |
| | | ගොන්නෝරුව බඳගිරිය මීගහජදුර මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්කර ගැනීමේ ව්‍යාපෘතිය |
| | | වීරකැටිය නගර සංවර්ධනය සඳහා ඉඩම් අත්කර ගැනීමේ ව්‍යාපෘතිය |
| | | වලස්මුල්ල නගර සංවර්ධනය සඳහා ඉඩම් අත්කර ගැනීමේ ව්‍යාපෘතිය |
| | | හම්බන්තොට පිටත වටරවුම පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්කර ගැනීමේ ව්‍යාපෘතිය |
| 9 | මධ්‍යම- I | කිරිමැටිය - මහනුවර පාර |
| | | අම්පිටිය - පිච්චමල් වත්ත පාර |
| | | බදුල්ල - චෙන්කලාඩි මාර්ගය |

| | | |
|---|---|---|
| | | මධ්‍යම අධිවේගී මාර්ගය |
| 10 | මධ්‍යම- II | මොරගහකන්ද - කලුගඟ ව්‍යාපෘතිය |
| | | වයඹ ඇල ව්‍යාපෘතිය |
| | | කුරුණෑගල - හබරණ නව දුම්රිය පාර |
| | | මධ්‍යම අධිවේගී මාර්ගය - අදියර IV |
| 11 | සබරගමුව | ඇහැළියගොඩ - දෙහිඕවිට මාර්ගය පුළුල් කිරීම |
| | | රත්නපුර විකල්ප මාර්ගය |
| | | රක්වාන- මාදම්පේ- දෙනියාය මාර්ගය |
| 12 | වයඹ | මධ්‍යම අධිවේගී මාර්ගය |
| | | කුරුණෑගල හබරණ දුම්රිය මාර්ගය |
| | | මොරගහකන්ද ව්‍යාපෘතිය |
| 13 | ඌව | බදුල්ල - වෙංකලඩි මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය |
| | | තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය |
| | | කුඹුක්කන් ඔය ව්‍යාපෘතිය |
| | | මහියංගණ - බිබිල මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය |
| | | නුවරඑළිය - බදුල්ල මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය |
| | | දෙමෝදර - ස්ප්‍රිංවැලි - බදුල්ල මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය |
| | | උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය |
| | | මොරාණ ජලාශ ව්‍යාපෘතිය |
| 14 | උතුරුමැද | උමං ඇල ව්‍යාපෘතිය - උතුරු මැද පළාත් මහ ඇල ව්‍යාපෘතිය - පොලොන්නරුව |
| | | යාන් ඔය ව්‍යාපෘතිය |
| | | යාන් ඔය ව්‍යාපෘතිය , වම් ඉවුර ඇල |
| | | උතුරු මැද පළාත් මහ ඇල ව්‍යාපෘතිය - අනුරාධපුර |
| | | කිරිඔය අලිමණ්කඩ |
| | | කදුරුවෙල - නගර සංවර්ධන ව්‍යාපෘතිය |
| | | මෛත්‍රීපාල අන්තර් ඡේදනය |
| | | මෛත්‍රීපාල අන්තර් වටරවුම |
| | | ගුවන් හමුදා කදවුර |
| | | මරදන්කඩවල හබරණ මාර්ගය |
| | | මොරගහකන්ද කළුගඟ කවුඩුළුවැව උප ප්‍රධාන ඇල |
| | | අනුරාධපුර ඒකාබද්ධ නගර සංවර්ධන ව්‍යාපෘතිය |
| | | ඇළහැර ඇල ව්‍යාපෘතිය |
| 15 | නැගෙනහිර | යාන් ඔය ජල ව්‍යාපෘතිය |
| | | රඹුක්කන ඔය ජල ව්‍යාපෘතිය |
| | | මුන්දනායරු ගංගා ද්‍රෝණි ව්‍යාපෘතිය (මඩකලපුව) |
| | | මුන්දනායරු ගංගා ද්‍රෝණි ව්‍යාපෘතිය (අම්පාර) |

# 3 පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

## 3.1 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| අයවැය 2021 රු. | | සටහන | 2021 රු. | තත්‍ය නැවත ගලපන ලද 2020 රු. | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | 115,316,600 | 68,164,750 | |
| - | ආදායම් බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසිඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 115,316,600 | 68,164,750 | |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | 115,316,600 | 68,164,750 | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 966,664,993 | 578,480,000.00 | ඒසිඒ-3 |
| - | තැන්පතු | | 60,116,645 | 145,657,846.00 | ඒසිඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 34,139,173 | 25,991,398.00 | ඒසිඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | 119,601,489 | 5,553,159.00 | |
| - | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | **1,180,522,300** | **755,682,403** | |
| - | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | **1,295,838,901** | **823,847,153** | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ) | | 54,297,969 | | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ) | | 1,241,540,932 | 823,847,153 | |
| | අඩු කළා : වියදම් | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | - | |
| - | පුනරාවර්තන වියදම් | | - | | |
| - | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 373,503,388 | 345,360,167.00 | ඒසීඒ-2(ii) |
| - | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 98,971,217 | 76,296,473.00 | |
| - | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 8,319,044 | 8,996,597.00 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| - | මුළු පුනරාවර්තන වියදම් (ඊ) | | **480,793,649** | **430,653,237** | |
| | මූලධන වියදම් | | | | |
| - | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 10,739,522 | 5,542,918.00 | ඒසීඒ-2(ii) |
| | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 32,596,948 | 4,050,376.00 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| - | හැකියා වර්ධනය | 14 | 2,058,903 | 3,840,076.00 | |
| - | වෙනත් මූලධන වියදම් | 15 | 566,474,993 | 201,000,000.00 | |
| - | මුළු මූලධන වියදම් (උ) | | **611,870,366** | **214,433,370** | |
| | තැන්පතු ගෙවීම් | | 106,226,556 | 107,672,919.00 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 36,124,024 | 24,106,240.00 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 142,350,580 | 131,779,159 | |
| | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | 1,235,014,595 | 776,865,766.00 | |
| - | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | | 6,526,337 | 46,981,387 | |
| | අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය | | 6,526,337 | - | ඒසීඒ-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | - | 46,981,387.00 | ඒසීඒ-3 |
| | | | - | - | |

## *3.2* 2021 දෙසැම්බර් 31 දිනට ම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

**2021 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | තක්‍ය 2021 රු. | 2020 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 426,082,908.78 | 396,409,230.00 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 93,219,454.80 | 91,234,604.00 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **519,302,363.58** | **487,643,834.00** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 89,112,146.32 | 41,017,385.00 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 426,082,908.78 | 396,409,230.00 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **සංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 4,107,308.48 | 50,217,219.00 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **519,302,363.58** | **487,643,834.00** |

පිටු අංක...07...සිට ...32... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ....83.. සිට ...41..... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත නොවන්නේ වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ..... | ..... | ..... |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරී | ගණන්දීමේ නිලධාරී | ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 2022.02.24 | දිනය : 24/02/2022 | දිනය : 24/02/22 |
| වී. පී. කේ. අසුම පැල්පිට ලේකම් ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය | පී. ඩී. ඩී. එස්. මුතුකුමාරණ රජයේ ප්‍රධාන තක්සේරුකාරය තක්සේරු දෙපාර්තමේන්තුව අංක 748, මරදාන පාර. | වම්.එච්.එස්.පී.කේ. ද සිල්වා ප්‍රධාන ගණකාධිකාරී තක්සේරු දෙපාර්තමේන්තුව කොළඹ -10. |

## *3.3* මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසිඒ-සී

**2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | තත්‍ය | |
|---|---|---|
| | 2021 රු. | නැවත ගලපන ලද 2020 රු. |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර ලාභ | 115,316,600 - | 56,802,482 - |
| ආදායම් නොවන ලැබීම් | 119,601,489 | 3,137,004 |
